www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ්ගේ ජයග්‍රහනයට ශ්‍රී ලාංකික ප්‍රතිචාරය: පරාධීනතා ප්‍රකාශනයක්

## Sri Lankan reaction to Bush victory: a declaration of dependence

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2004 නොවැම්බර් 19**

ඇමරිකානු ජනාධිපති හැටියට ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් තේරී පත්වූ පසු ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය විසින් ඔහුට යවන ලද සුබ පැතුම් ලිපි මෙවන් අවස්ථාවල දී සාමාන්‍යයෙන් යවනු ලබන රාජ්‍යතාන්ත්‍රික පනිවුඩවලට වඩා වෙනස් ය. සැබැවින් ම පරාධීනතා ප්‍රකාශන මාලාවක් වූ මෙම පනිවුඩ පිලිබිඹු කරන්නේ ඊනියා තුන්වන ලෝකයේ පාලක ප්‍රභූ කන්ඩායම් පුරා පැතිර පවත්නා බියගුලු ආකල්පය යි. ඇමරිකා එක්සත් ජනපදයේ නග්න යුද්ධමය ආක්‍රමනකාරීත්වය ඉදිරියේ මේ එකිනෙකා ඉරාකය සහ ඇෆ්ඝනිස්ථානය වැනි රටවලට අත් වූ ඉරනම තමන්ට ද අත් වීමෙන් බේරීගැනීමට ද ඒ සමගම ඊනියා "ත්‍රස්ත විරෝධී යුද්ධය" තමන්ගේම උවමනාකම් සඳහා හැකි නම් පාවිච්චි කිරීමට ද උත්සාහ කරති.

ඇමරිකාවේ ජනාධිපතිවරයාට යැවූ ලියුමේ දී, ලංකාවේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මෙසේ කීවා ය, "පෙර නුවූ විරූ මෙම මැතිවරන ප්‍රතිඵල පිලිබිඹු කරන්නේ ඇමරිකානු ජනතාව ඔබගේ ප්‍රතිපත්ති සහ නායකත්වය කෙරේ දක්වා ඇති විශ්වාසය" යි. බුෂ්ගේ පලමුවන ජනාධිපතිධුර වාරයේ දී වර්ධනය වූ එක්සත් ජනපද - ශ්‍රී ලංකා සබඳතා සිහි කල කුමාරතුංග "අපගේ ද්විපාක්ෂික සබඳතා පිලිබඳව වෙලඳාම, ආයෝජන, ආරක්ෂාව සහ පොදු දේශපාලන ප්‍රශ්න, විශේෂයෙන්ම ත්‍රස්තවාදයට එරෙහි සටන සම්බන්ධයෙන් අප අතර හවුල්කාරිත්වයක් තහවුරු වීම කරා පැහැදිලිව දැක ගත හැකි වර්ධනයක් සිදු වී තිබේ."

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුල "ත්‍රස්තවාදයට එරෙහි සටන" යන වචන වනාහි වොෂින්ටනය තමිල් ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊය)ට තර්ජනකාරී දැඩි බලපෑම් දැමීම මගින්, එම සංවිධානයේ වෙනම රාජ්‍ය ඉල්ලීම අතහැර දැමීමට ද රට තුල විසිවසරක් පුරා පවත්නා ම්‍රෘග සිවිල් යුද්ධය සාකච්ඡා මගින් විසඳාලීමට ද වොෂින්ටනය දරන්නා වූ යත්නය පිලිබඳ වක්‍ර ඇඟවීමකි. ඇය තවදුරටත් මෙසේ කියා සිටියා ය. "ශ්‍රී ලංකාවේ ආන්ඩුව ද මහජනයා උතුම් වූ ඔබගේ ආන්ඩුව විසින් මෙම ගැටලුව පිලිබඳව සාකච්ඡා මගින් කෙරෙන විසඳුමකට පක්ෂව ඔබ විසින් ගනු ලැබ පවත්නා ප්‍රතිපත්තිමය ආස්ථානය ගැඹුරින්ම අගය කර සිටී."

ඇගේ අගමැති මහින්ද රාජපක්ෂ බුෂ්ට තවත් වර්නනා පැටවී ය; "ත්‍රස්තවාදයේ ව්‍යසනය අරක්ගත් බොහෝ රටවලට ඔබ අපේක්ෂා සාධා දුන්නෙහි ය... ඔබේ ජනාධිපති ධුරයේ දෙවන වාරයට පත්වීම මගින් ඔබ අවංකත්වයට, කැපවීමට, සහ ප්‍රයාපනය කවරදා හෝ විජයග්‍රහනය කරන බව තහවුරු කර ඇත." රාජපක්ෂ මෙසේ ද කීය, "සාමය සහ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ කාර්යමාර්ගය උදෙසා දෘඪතරව නැගී සිටීම මගින් ඔබ ඉතිහාසය නිර්මානය කර තිබේ."

කුමාරතුංග වත්, රාජපක්ෂ වත් බුෂ් පාලනයේ "ත්‍රස්ත විරෝධී යුද්ධය" එනම් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් දැනටමත් ඇෆ්ඝනිස්ථානය නව යටත්විජිතවාදී ලෙස යටත් කොට ලෝක ආධිපත්‍යය එල්ල කොට ගෙන දියත් කර තිබෙන ලෝක ආධිපත්‍යය අරමුනු කර ගත් නිර්ධය ප්‍රහාරයේ සැබෑ ස්වභාවය ගැන සඳහනක් හෝ නොකලාහු ය. මොවුන් බුෂ්ට දීන-යටත් සුබ පැතුම් යවන වෙලාවේ ම එක්සත් ජනපද මිලිටරිය ඉරාකයේ ෆලූජා නගරය කුඩු පට්ටම්කර දමමින් තිබුනි. එය වනාහී නූතන යුද්ධ ව්‍යාපාරයක දී සිදු කරන ලද අතිශය තුච්ඡ අපරාධවලින් එකක් ලෙස, නාසීන් දෙවන ලෝක යුද සමයේ යටත් කර ගත් යුරෝපය තුල කරන ලද ලේ වැකි මර්දනයන් සමග සම තැන් ගති.

පසුගිය සැප්තැම්බරයේ දී එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය ඇමතූ චන්ද්‍රිකා කුමාරතුංග, එක්සත් ජනපදය විසින් ඉරාකය ආක්‍රමනය කිරීම සහතිකෙන්ම හෙලා නුදුටු අතර, ඒ කෙරේ මෘදු විවේචනශීලී ආකල්පයක් ගත්තා ය. "අපි ඉරාකය තුල සිදුවෙමින් පවත්නා ප්‍රචන්ඩත්වය, අස්ථාවරත්වය, ජීවිත හානිය, සහ මානව වේදනාව ගැන ගැඹුරින්ම ශෝකයට පත්ව සිටිමු." යි ඇය කීවාය. පරෙස්සම් විය යුතු යයි ද ප්‍රචන්ඩත්වය නිම කොට ස්ථාවරත්වය හා සාමය නිර්මානය කිරීමට ආරක්ෂක පියවරයන් පමනක් නොසෑහෙනු ඇත." යයි ද කියා සිටියා ය. බුෂ් යලි තෝරා පත් කර ගැනීමෙන් පසුව කෙසේ වෙතත් ඉතා සුලු විවේචනාත්මක ඇඟවුමක් පවා පවත්වා ගැනීමට ඉඩදිය නොහැකි විය. මන්ද යත්, සියල්ල රැඳී පවත්නේ වොෂින්ටනය සමග "හවුල් සම්බන්ධතාවය" පවත්වාගෙනයාම මත

යයි ශ්‍රී ලංකාවේ පාලක පන්තිය වටහාගෙන තිබෙන හෙයිනි.

විපක්ෂ එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) ද එම නමස්කාර ප්‍රතිපත්තිය ම පිලිපැද්දේ ය. එජාපෙ නායකයා බුෂ්ට යැවූ පනිවුඩයේ මෙසේ පැවසී ය. ''මා අගමැතිව සිටි වාරයේ දී අපට ඔබතුමන් සමග තහවුරු කර ගැනීමට ලැබුනු සම්බන්ධතාවය මම ඉමහත්සේ අගය කරමි. සාර්ථක සටන් විරාමයක් සාකච්ඡා කර තහවුරු කර ගැනීමට ජාත්‍යන්තර ප්‍රජාව ඒකාබද්ධ කර ගැනීම අපට කර ගත හැකි වූයේ ඔබ පෞද්ගලිකවම සිදුකල තිරසර දිරිදීම තුලිනි. එමගින් බොහෝ අභියෝගයන්ට මුහුන දී මගේ රට තුල සාම ක්‍රියාවලියක මුල පුරා ගැනීමට සමත් වීමු. ඉදිරි සිව් වස තුල ඔබටද ඔබගේ නායකත්වය යටතේ ඉදිරි සිව්වස තුල එක්සත් ජනපදයට ද, ප්‍රජාතන්ත්‍රවාදී අදහස් හා පරමාර්ථ අගය කරන්නන් සඳහා මෙම ලෝකය වඩාත් ආරක්ෂිත ස්ථානයක් බවට පත්කිරීමේ ඔබේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට ඉඩ ලැබේවායි මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.''

එජාපෙ ප්‍රධාන සංරචකය වූ එක්සත් ජාතික පක්ෂය එහි මූලාරම්භයේ පටන්ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග සමීපව සම්බන්ධ වී තිබී ඇත. පසුගිය වර්ෂයේ දී වික්‍රමසිංහ එක්සත් ජාතීන්ගේ මන්ඩලය ආමන්ත්‍රනය කල අවස්ථාවේදී එක්සත් ජාතීන්ගේ මන්ඩලයේ භේද නිසා බුෂ්ට ඉරාකය තනි මතයේ ආක්‍රමනය කිරීමට හැර වෙන දෙයක් කරන්නට ඉඩ ඉතුරුවී තිබුනේ නැතැයි කියමින් එක්සත් ජනපදය විසින් ඉරාකය නීති විරෝධී ලෙස ආක්‍රමනය කිරීම නිර්ලජ්ජිතව ආරක්ෂා කලේ ය.

යූඇන්පීයට වෙනස්ව — වත්මන් පාලක සන්ධානයේ ප්‍රධාන සංරචකය වූ කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) — අතීතයේ දී ජන සහාය ගොනු කර ගැනීම සඳහා අධිරාජ්‍ය විරෝධී ජනතාවාදී වාංමාලා යොදා ගෙන ඇත. හිටපු අගමැතිනිය — සිරිමාවෝ බන්ඩාරනායක, කුමාරතුංගගේ මෑනියන්දෑ — 1960 ගනන්වල දී සහ 1970 දී නොබැඳි සමුලුවේ සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටු කලා ය.

සෝවියට් සංගමයේ සහ සීතල යුද්ධයේ රාමුව බිඳ වැටීම ශ්‍රී ලංකාවේ ද තුන්වන ලෝකයේ සෙසු රටවල ද පාලක පන්තීන්ට ස්ටැලින්වාදී පාලන තන්ත්‍ර සහ අධිරාජ්‍යවාදය අතර තුලනය කිරීමට තිබූ ඉඩකඩ හමාර කලේ ය. 1990 ගනන්වල දී ශ්‍රීලනිපය ඒ අධිරාජ්‍යවාද-විරෝධී ඉරියව් අතහැර දැමුවේ ය. අද දින බුෂ් පාලනාධිකාරය ප්‍රධාන එක්සත් ජනපදය සමග සමීප සබඳකම් පවත්වාගැනීමේ අවශ්‍යතාවය පිලිබඳව එජාපය සහ ශ්‍රීලනිපය අතර අති මූලික වෙනස්කම් කිසිවක් ඇත්තේ නැත.

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අනෙක් ප්‍රධාන පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද — සිංහල ජාත්‍යෝත්තමවාදය සහ ජනතාවාදී පමනක් නොව සමාජවාදී පවා වචනවලින් යුත් ජන සෝෂාවක යෙදී සිටින පක්ෂයකි — ඉරාකයේ එක්සත් ජනපද ආක්‍රමනයට කුමන හෝ විරුද්ධත්වයක් හෝ අතහැර දමා තිබේ. ප්‍රථම වතාවට ආන්ඩුවට සම්බන්ධ වී සිටින එම පක්ෂය වෙන ම අන්දමකින් හෝ බුෂ් ද ඔහුගේ ''ත්‍රස්ත විරෝධී'' යුද්ධයද සමග කුමාරතුංග පවත්වා ගෙන යන සන්ධානයට සත්තකින් ම විරෝධය ප්‍රකාශ කලේ නැත.

එක්සත් ජනපද නිලවරනයට ආසන්නයේ ඔක්තෝබර් 31 දින *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ පලවූ කතුවැකියක් බුෂ් පාලනාධිකාරය කෙරේ ලංකාවේ දේශපාලන සංස්ථාපිතයේ ආකල්පය මෙසේ සාරාංශ ගත කෙලේ ය. එක්සත් ජනතා නිදහස් සංධානයේ අලුත් ආන්ඩුව ''එක්සත් ජනපද විරෝධී සටන්පාඨ හඬනැගීම එක්සත් ජනපදයේ ආධාරයෙන් තොරව ආර්ථිකය පවත්වාගෙන යා නොහැකි තත්වයකට පත්ව තිබෙන රටකට කල නොහැකි බව ඉක්මනින් වටහා ගෙන ඇතැ''යි සටහන් කල එම පත්‍රය ඉක්බිති මෙසේ කීය, ''ජනාධිපති බුෂ් විසින් ත්‍රස්තවාදයට එරෙහිව ගෙන යන යුද්ධය'' නිර්දය යː බොහෝවිට මෘග ය, එහෙත් අප ත්‍රස්තවාදයට එරෙහිව කර ගෙන යන යුද්ධයට ඉන් වාසි සහගත ප්‍රතිඵල ලැබී ඇත.''

වෙනත් වචනවලින් කිවහොත්, ලංකාවේ පාලක කව එල්ටීටීඊ සංවිධානය සාකච්ඡා මේසයට ගාල් කර ගැනීම සඳහා වොෂින්ටනයේ ආධාර තමන්ට ලබා ගැනීමට නම් බුෂ් ඉරාකය තුල කරගෙනයන අපරාධයට සහයෝගය දීම අවශ්‍ය බව පිලිගනිති. කොලඹ පාලනයට ද ''ත්‍රස්ත විරෝධී යුද්ධය'' යුද්ධයක් ඇත. එය වනාහී රටේ දෙමල සුලුතරයට එරෙහිව දිගු කාලයක් තිස්සේ කරගෙන යනු ලබන අගතීන්ට එරෙහිව නැගෙන මොනම විරුද්ධත්වයක් වුව පාගා දැමීම සඳහා දශක දෙකක් තිස්සේ කරන ලද ලේවැකි ප්‍රහාරය යි.

ශ්‍රී ලංකාවේ මහ කොම්පැනි ප්‍රභූවේ සමහර කොටස් මෙම දිවයින ගෝලීය නිෂ්පාදන සන්තතීන් තුලට ඒකාග්‍ර කර ගැනීම ෂඳහා ඔවුන්ට පවත්නා අධ්‍යාසයන්ට බාධාවක් ව පවත්නා වූ සිවිල් යුද්ධ ගැටුම අවසන් කොට දමා දැන් ඉන්දියාවට ගලා එන විදේශ ආයෝජනවලින් වාසියක් තමන්ට ද ලබාගැනීමට බලා සිටිති.

පසුගිය දශක දෙකෙන් වැඩි කාලයක් තිස්සේ එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නොතකා හැර සිටියේ ය. එහෙත් දැන් එක්සත් ජනපදයට අවශ්‍ය වී තිබෙන්නේ මෙ රටේ වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවයන්ගේ කේන්ද්‍රයක් බවට පත්ව තිබෙන ඉන්දියාව අස්ථායි කිරීමට තුඩුදෙන භයානක බලපෑමක් ඇති කරන්නා වූ ලංකාවේ සිවිල් යුද්ධය අවසන් කර දැමීමට ය.

නිලවසයෙන් සිවිල් යුද්ධයට සාකච්ඡා මගින් විසඳුමක් ලබා දිය යුතු යයි කියන ගමන්ම බුෂ් පාලනාධිකාරය එල්ටීටීඊ සංවිධානය තහනම් කරන

ලද ත්‍රස්තවාදී ලැයිස්තුවෙන් ඉවත්කිරීමට යලි යලිත් ප්‍රතික්ෂේප කොට තිබේ. තර්ජනය උවමනාවටත් වඩා පැහැදිලි ය. එල්ටීටීඊ සංවිධානය එක්සත් ජනපද ඉල්ලීම්වලට එකඟ වන්නේ නැති නම්, වොෂින්ටනය එම සංවිධානයට වෙනත් ''ත්‍රස්තවාදී'' සංවිධානවලට බෙදූ හැන්දෙන් ම බෙදීමට පසුබට නො වනු ඇත.

ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතයේ කොටස් බුෂ් පාලනාධිකාරයට සහාය දුන්නේ ''ත්‍රස්තවාදයට විරුද්ධ යුද්ධය'' කරගෙන යාමේ දී බුෂ් පාලනාධිකාරය දැක් වූ නිර්දය භාවය නිසා ම ය. ඔවුන් ගනන් බැලුවේ එල්ටීටීඊ සංවිධානය කොලඹ පාලනයේ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි තාඩනය කර දැමීමේදී කෙරී පාලනයට වඩා හොඳින් සටන් වදිනු ඇතැයි කියා ය. යලිත් සිවිල් යුද්ධය ඇරඹුනහොත් කොලඹ පාලනයට මිලිටරි සහාය දීමට කෙරීට වඩා බුෂ් උත්සුක වනු ඇතැයි ද ඔවුහු ගනන් බලති. බුෂ් යටතේ ඉහල පෙලේ මිලිටරි නිලධාරීන් හා මිලිටරි තක්සේරු කන්ඩායම් ගනනාවක් ම කොලඹට පැමින ඇත.

එක්සත් ජනපද ජනාධිපතිවරනයෙන් ඉක්බිති දිනයේ දී දක්ෂිනාංශික *ද අයිලන්ඩ්* පුවත්පත මෙසේ තර්ක කලේ ය: ''මේ රටේ ත්‍රස්තවාදය පිලිබඳ ප්‍රශ්නය පැන නැගුනු තැන් සිට අන් කවර ලෝක නායකයෙකු වත් ජනාධිපති බුෂ් තරම් දැඩිව එයට විරුද්ධව ඉදිරිපත් නොවූ නිසා ඔහු අන් කවරෙකුට ද වඩා හොඳින් මේ රටේ අවශ්‍යතාවන් ඉටු කරනු ඇත. ඔහු ද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචර්ඩ් ආමිටේජ් වැනි ඔහුගේ නිලධාරීන් ද එල්ටීටීඊයට නොවලහා කීවේ: ''ත්‍රස්තවාදය වචනයෙන් හා ක්‍රියාවෙන් නතර කරනු. එක්සත් ජනපදය එල්ටීටීඊ සංවිධානය විදේශ ත්‍රස්තවාදී සංවිධාන ලැයිස්තුවෙන් ඉවත් කරන්නේ එවිට පමනි. මෙය එල්ටීටීඊ සංවිධානයේ දිගින් දිගටම කරගෙන යන ත්‍රස්තවාදී ක්‍රියා කෙරේ මෘදු ආකල්පය කර ගත් යුරෝපීය සංගමයේ ජාතීන් ගේ වැනෙන සුලු ආකල්පයට වඩා කැපී පෙනෙන ලෙස වෙනස් විය.''

දෙමල සුලුතර ජනයාට එරෙහිව ත්‍රස්ත පාලනයක් යුක්තිසහගත කිරීම සඳහා ද දෙමල ජනයාගේ දුක්ගැනවිලිවලට කිසිදු යුක්තිසහගත භාවයක් ඇත්තේ නැතැයි කියාපෑම සඳහා ද එල්ටීටීඊ සංවිධානයේ ත්‍රස්ත ක්‍රියා දිගු කාලයක් තිස්සේ යොදාගෙන සිටින ලංකාවේ පාලක ප්‍රභූන්ගේ *ද අයිලන්ඩ්* පුවත්පතේ ද අදහස් සමග ජාත්‍යන්තර නීතිය ද ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද පිලිබඳව බුෂ් දක්වන පිලිකුල මුලුමනින්ම ගැලපේ. බුෂ් පාලනාධිකාරය ගුවන්තනාමෝ සිරකඳවුර පිහිටුවීමට බොහෝ කලින්, ශ්‍රී ලංකාවේ රාජ්‍යය දෙමල ''ත්‍රස්තවාදී සැකකරුවන්'' යයි නම් කරන ලද්දන් දහස් ගනනක් හිතුවක්කාර ලෙස සිරගත කලේ ය. සමහර අවස්ථාවල දී වධයට ලක් කලේ ය.

එහෙත්, ''දන්න යකා නොදන්න යකාට වඩා හොඳය''යි තම කතු වැකියට තියුනු මාතෘකාවක් සැපයූ *අයිලන්ඩ්* පුවත්පත එක්තරා තැතිගැන්මක් ද නොහැඟවූවා නොවේ. බුෂ් පාලන තන්ත්‍රයේ ඉවබව නැති පිලිවෙත් ශ්‍රී ලංකාවේ ධනපති පන්තියේ ක්ෂනික අරමුනු සමග සම්පාතවන බව පෙනී යන නමුත්, ''ත්‍රස්තවාද විරෝධී යුද්ධය'' ඉන්දියානු උපමහාද්වීපය මත ද ජාත්‍යන්තරව ද භයානක අස්ථායිකාරී සාධකයක් ය යි බියසැක ද පවතී.

''බුෂ් වනාහී මෙතෙක් සිටි අතිශයින්ම එපා කරපු ජනාධිපතිවරුන්ගෙන් එකෙකු ය'' යි කියා සිටි එම පුවත්පත ''ලෝක ජනමත සැම්පල විමසුමක් සියයට 77ක්ම බුෂ්ට වඩා කෙරීට කැමැත්ත දැක් වී යයි පෙන්නුම් කලේ ය. ''ලෝක පොලිස්කාරයා හැටියට තඩි පොල්ල වනන, ආක්‍රමනකාරී පිලිවෙත් සහිත ජනාධිපති බුෂ් ලංකාවේ ජනයාට ද අප්‍රිය ය'' යි එය සටහන් කලේ ය.

එහෙත් කොලඹ පාලක ප්‍රභූව මැනවින් දන්නා පරිදි, මොන අවදානමක් තිබුනත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට නමස්කාර කිරීම හැර වෙනත් විකල්පයක් ඔවුන්ට ඇත්තේ නැත. ''හවුල් සබඳකමක්'' පිලිබඳ කුමාරතුංග කොයිතරම් කයිවාරු ගැසුවත්, මොවුන් අතර පවතින්නේ ආර්ථික, යුද්ධමය සහ දේශපාලන මොනම ක්ෂේත්‍රයක වුව සියලුම ක්ෂේත්‍රවල දීන දාසත්වයකි. බ්‍රිතාන්‍ය විජිත පාලකයන් දිවයිනෙන් ඉවත්ව අඩ සියවස යන්තමින් ඉක්මවත්ම ජනාධිපතිවරියගේ බුෂ් නමස්කාරය වනාහී අද දින වඩාත්ම බලවත් අධිරාජ්‍යවාදය ඉදිරියේ පරාධීන ප්‍රකාශනයකි.

© www.wsws.org